www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - I

නම/විභාග අංකය :- .............................................................. කාලය: පැය 01 යි.

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) සප්තකයේ ස්වර අතුරෙන් අචල ස්වර යුගලය කුමක් ද?

(1) ස, රි (2) ස , ග (3) ස . ම (4) ස , ප

(02) සරි සගරිස . රිග රිමගරි. ......... මෙම ස්වර අභ්‍යාසයේ ඉළඟ ස්වර ඛණ්ඩය තෝරන්න.

(1) ගරි මගමරි (2) ගරි සගරිස (3) ගම ගපමග (4) ගම පගමග

(03) රාගයකට අයත් තොරතුරු ඇතුළත් කොට තාලානුකූලව නිර්මාණය කර ඇති ගීත විශේෂය වනුයේ,

(1) ස්වර ස්ථාපන ගීත (2) ලක්ෂණ ගීත
(3) මධ්‍යලය ගීත (4) රාගාශ්‍රිත සරල ගීත

(04) ෂඩ්ජය සංවාදී ස්වරය ලෙස යෙදෙන විකෘති ස්වර හතරකින් යුක්ත රාගයකි.

(1) භෛරවී (2) බිලාවල් (3) යමන් (4) කාෆි

(05) තීවර මධ්‍යමය (ම්) යෙදෙන රාගය ආශ්‍රිත සරල ගීතයකි.

(1) එන්න මදනලේ...... (2) සාදු දන්ත දා......
(3) පාරමිතා බල පූජිත..... (4) කළිඳු ගංගාදෙනියේ......

(06) යමන් රාගයේ අනුවාදී ස්වර වනුයේ,

(1) ස රි ග ම් ප (2) ස රි ම් ප නි
(4) ස රි ග ප ධ (4) ස රි ම් ප ධ

(07) යමන් රාගය හා භෛරවී රාගය යන රාග දෙකටම පොදු වූ ලක්ෂණයකි.

(1) සම්පූර්ණ ජාතියට අයත් රාග වීම (2) රාග දෙකෙහිම විකෘති ස්වර සමාන වීම
(3) අනුවාදී ස්වර සමාන වීම (4) රාග දෙකෙහි ජාති අසමාන වීම

(08) සර්ගම් ප්‍රබන්ධ විශේෂය සඳහා අදාළ නොවන කරුණ තෝරන්න.

(1) ස්වර පමණක් යොදා ගැනීම (2) රාග ලක්ෂණ විස්තර කිරීම
(2) තාලානුකූලව නිර්මාණය වී තිබීම (4) රාග සංගති යොදාගෙන තිබීම

(09) රාගධාරී ඛ්‍යාල් ගීත සඳහා බහුලව යොදා ගන්නා හිස්දුස්ථානී තාලය කුමක් ද?

(1) ජප් තාලය (2) දීප්චන්දි තාලය (3) ඛෙම්ටෝ තාලය (4) ත්‍රිතාලය



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk


www.agaram.lk

(10) අවග්‍රහයෙන් ගැයීමට සුදුසුම ගීතය තෝරන්න.

(1) දියගොඩ සැමතැන....  (2) හෙළ ජාතික අභිමානේ

(3) අම්මා සඳකි.  (4) සොම්නස හෝ සන්තාපය

- අංක 11 සිට 14 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූප සටහන් ඇසුරු කර ගන්න.




(11) කායදා, පල්ටා, පරන්, රේලා, තිහායි වැනි ශිල්ප ක්‍රම වාදනය සඳහා යොදා ගනු ලබන සංගීත භාණ්ඩය කුමක් ද?

(1) A  (2) B  (3) C  (4) D

(12) B අක්ෂරයෙන් දැක්වෙන භාණ්ඩය වැයීම සඳහා ප්‍රකට වාදන ශිල්පියෙකි.

(1) ශකීර් හුසේන්  (2) රවි ශංකර්

(3) හරි ප්‍රසාද් චෞරසියා  (4) රණධීර් රෝයි

(13) වංග සංගීතය සඳහා බහුලව යොදාගන්නා දිල්රුබාව හා බෙහෙවින් ම සමාන වන භාණ්ඩය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.

(1) A  (2) B  (3) C  (4) D

(14) අමීර් කුස්රු සංගීතඥයා විසින් නිර්මාණය කරන ලද භාණ්ඩ දැක්වෙන ඉංග්‍රීසි අක්ෂර දෙක වනුයේ,

(1) A - D  (2) B - C  (3) A - B  (4) B - D

(15) ආනන්ද සමරකෝන් සූරීන් විසින් ගයන ලද ගීතයකි.

(1) ඕලු පිපිලා විල ළෙලදෙනවා  (2) එන්ඩද මැණිකේ මමත් දියඹටා

(3) වරෙන් හීන් සැරේ  (4) ශාන්ත මේ රෑ යාමේ

(16) ශ්‍රී ලංකා ගුවන් විදුලියෙන් පටිගත කළ මුල්ම ගීතය හා එය ගයන ලද ගායකයා පිළිබඳව දැක්වෙන නිවැරදි පිළිතුරතෝරන්න.

(1) ඕලු පිපිලා විල ලෙලදෙනවා - සුනිල් ශාන්තයන්

(2) අක්කෙ අක්කෙ අර බලන්නකෝ - සුනිල් ශාන්තයන්

(3) ඕලු පිපිලා විල ලෙලදෙනවා - ආනන්ද සමරකෝන් සූරීන්

(4) අක්කෙ අක්කෙ අර බලන්නකෝ - ආනන්ද සමරකෝන් සූරීන්

(17) "පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට" යන ගීතය පිළිබඳව දක්වා ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ගුත්තිල කාව්‍යයට අයත් අනාඝාතාත්මකව ගැයෙන ගීයකි.

(2) සැළලිහිණි සංදේශයට අයත් සමුද්‍රඝෝෂ විරිතට අනුව ගැයෙන ගීයකි.

(3) සැළලිහිණි සංදේශයට අයත් සොළොස්මත් සේ ගීයකි.

(4) ගුත්තිල කාව්‍යයට අයත් සමුද්‍ර ඝෝෂ විරිතට අනුව ගැයෙන ගීතයකි.

(18) වාචික අභිනයෙන් තොරව රංගනයෙහි යෙදෙන නාට්‍ය සම්ප්‍රදාය සඳහන් කරන්න.

(1) මුද්‍රා නාට්‍ය  (2) ගීත නාට්‍ය  (3) ඔපෙරා  (4) කෝලම්



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(19) බෙරහඬ, දෙපානෝ, රාමායනය, බැලසන්ත, මෙම නාට්‍ය පිළිවෙළින් අයත් නාට්‍ය සම්ප්‍රදායන් නිවැරදිව දක්නට ඇති පිළිතුර වනුයේ

(1) නූර්ති , නාඩගම්, ගීත නාට්‍ය. නව නාට්‍ය
(2) නාඩගම්, නව නාට්‍ය, නූර්ති, ගීත නාට්‍ය
(3) නව නාට්‍ය, ගීත නාට්‍ය, නූර්ති නාඩගම්
(4) ගීත නාට්‍ය, නූර්ති, නාඩගම්, නව නාට්‍ය

(20) ග්‍රැමෆෝනය සඳහා ලංකාවේ මුලින් ම තැටිගත කළ ගීත විශේෂය නම් කරන්න.

(1) හින්දි ගීත (2) නාඩගම් ගී (3) දේශාභිමානී ගී (4) නූර්ති ගී

(21) රබන්, බොංගෝ, ටැම්බරින්, ආදී තාල වාද්‍ය භාණ්ඩ යොදාගෙන රංගනයේ යෙදෙමින් ගායනා කළ ගීත විශේෂයකි.

(1) භජන් (2) කපිරිඤ්ඤා (3) ගසල් (4) කව්වාලි

(22) විභාග දෙකක් හෝ කිපයක් මැදිවන සේ මෙම සංකේතය යෙදීමෙන් අදහස් වනුයේ, ඊට අයත් ස්වර බන්ධය දෙවරක් වාදනය කළ යුතු බවයි.

(1) 𝄎 (2) 𝄋 (3) [[ ]] (4) ÷

(23) සරල ගීයක ආකෘතිය නිවැරදිව පිළිවෙළින් දැක්වෙන පිළිතුර වනුයේ,

(1) Introduction , chorus, Interlude, verse.
(2) Introduction , verse, Interlude, chorus.
(3) Interlude , verse, Introduction , chorus.
(4) Interlude , chorus, Introduction, verse.

(24) 256 340, 384 යන ස්වර සංඛ්‍යාත හිමි ස්වර පිලිවෙළින් දැක්වෙන නිවැරදි පිළතුර තෝරන්න.

(1) ස රි ම (2) ස ග ම (3) ස ම ප (4) ස ප ධ

(25) ව්‍යවහාරික සංගීතයේ දි යෙදෙන C‴ සහ 3/4 යන සංකේතවලින් ප්‍රකාශ වනුයේ,

(1) C minor scale සහ මාත්‍රා 3/3 ට ගැයෙන බවයි.
(2) C minor scale සහ මාත්‍රා 4/4 ට ගැයෙන බවයි.
(3) C major scale සහ මාත්‍රා 3/3 ට ගැයෙන බවයි.
(4) C major scale සහ මාත්‍රා 4/4 ට ගැයෙන බවයි.

රෑ s රැ / සේ s අ දි / නා s ලෙ / සේ s අත්
ලෙ ල දි / දී s වි දු / ලි ය ප / බා s s s

(26) ඉහත ගී පාදයේ ඇති සැදෑස්මත් සහ ගිමත් ගණන පිළිවෙළින් තෝරන්න.

(1) සදෑස්මත් 20 ගිමත් 24
(2) සදෑස්මත් 20 ගිමත් 26
(3) සදෑස්මත් 24 ගිමත් 26
(4) සදෑස්මත් 26 ගිමත් 28

- පහත සඳහන් ගී පාද ඇසුරු කරගෙන 27 සිට 30 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a) ආදරයේ උල්පත වූ අම්මා....
b) කඳුළු හෙලා නෑඹිලියට....
c) රුක් අත්තන මල මුදුනේ....
d) නැති බැරි මොහොතක පිහිටට ඉන්නේ....

(27) වෙස්සන්තර කාව්‍යයේ එන වැලපුම් ගී නාදරටාව අසුරෙන් නිර්මාණය කරන ලද ගීතයකි.

(1) a (2) b (3) c (4) d

(28) ප්‍රවීන සංගීතඥ රෝහණ වීරසිංහයන් විසින් සංගීතවත් කොට ගායනා කරන ලද මව්පිය ගුණ වරුණ ගීතය මින් කුමක් ද?

(1) a (2) b (3) c (4) d

(29) උකුසා වන්නමේ නාදමාලාව ඇසුරින් නිර්මාණය කරන ලද ගීතයකි.

(1) a (2) b (3) c (4) d

(30) නැළවිලි ගී නාද මාලාව ඇසුරෙන් නිර්මාණය කරන ලද සරල ගීතයකි.

(1) a (2) b (3) c (4) d



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(31) ගීත පටිගත කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා යොදාගත් පැරණිතම තාක්ෂණික මෙවලමකි.
(1) සංයුක්ත තැටි (2) කැසට් පටි (3) ග්‍රැමෆෝන් තැටි (4) ගුවන් විදුලි යන්ත්‍රය

(32) "පද්මභූෂණ" සම්මානයෙන් පිදුම් ලද භාරතයේ ප්‍රවීණ ගසල් ගායකයෙකි.
(1) හරි ප්‍රසාද් චෞරසියා (2) ජග් ජිත් සිං
(3) ඒ. ආර්. රහුමාන් (4) සකීර් හුසේන්

(33) ඉන්දියාවේ ප්‍රසිද්ධ "පද්ම ශ්‍රී" සම්මානයෙන් පිදුම් ලද ප්‍රවීන තබ්ලා වාදකයෙකි.
(1) ඒ ආර් රහුමාන් (2) උස්තාද් සකීර් හුසේන්
(3) හරි ප්‍රසාද් චෞරසියා (4) ජග් ජිත් සිං

(34) ගැමි ගී සඳහා නොගැළපෙන ප්‍රකාශයකි.
(1) ස්වර පරාසය සංකීර්ණ වීම (2) මුඛ පරම්පරාවෙන් පැවත ඒම
(3) නිර්මාපකයකු පිළිබඳව සඳහන් නොවීම (4) උස් හඬින් ගායනා කිරීම

(35) වයලින්, ගිටාර්, බටනලා ආදී සංගීත භාණ්ඩවල හඬ සාම්ප්‍රදායික භාණ්ඩවලින් තොරව විද්‍යුත් ක්‍රමයකට සැකසීම මෙනමින් හැඳින්වේ. මෙය නූතන යතුරු පුවරු හා පරිගණක මෘදුකාංගවල ඇත.
(1) Blue Rey (2) MIDI (3) Vikipediya (4) Sound Card

(36) භෛරවී රාගය ඇසුරෙන් තනු නිර්මාණය කරන ලද "බව්ජි බව්රා" හින්දි චිත්‍රපටයේ ඇතුළත් ගීතයක් වනුයේ,
(1) තෙරේමේරේ (2) තු ගංගාකි මෞජ්මේ
(3) ජනක ජනක පායල් (4) මධු බනමෙ රාජිකා

(37) "E F A B D C A G" යන අපරදිග ස්වර සංකේත පිළිවෙළින් පෙරදිග ස්වර සංකේත ලෙස ලියන්නේ කෙසේ ද?
(1) ග ම ධ නි රි ස ධ ප (2) ග ප ධ ම ග ස නි ධ
(3) ග ප ම ග රි ස ධ ප (4) ග ම රි ග රි ස ප ම

- පහත සඳහන් බටහිර සංගීත ප්‍රස්තාරය ඇසුරින් 38 - 40 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(38) මෙම ස්වර ප්‍රස්තාරයට අදාළ ටයිම් සිග්නේචරය (Time signature) තෝරන්න.
(1) $2_2$ (2) $2_4$ (3) $3_4$ (4) $4_4$

(39) ඉහත ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට නිවැරදි ලෙස ප්‍රස්තාර කළ විට ලැබෙනුයේ,
(1) ග ප / ප ග / ම ග / රි - / ග ම / ප ධ / නි - / - - /
(2) ග - ම / ප - ග / ම - ග / රි - - / ග - ම / ප - ධ / නි - - / - - - /
(3) ග ම / ප - ධ නි / ස් - නි ධ / ප - ප - / රි ග / ම - ප ධ / නි - - - / - - - -/
(4) ස - රි / ග - ස / රි - ස / නි - - / ස - රි / ග - ම / ප - - /- - -/

(40) ඉහත බටහිර ස්වර ප්‍රස්තාරය තුළ 1. 2. 3 යන අංකවලින් දැක්වෙන සංකේතවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) Treble clef, Semibreve, Dotted semibreve (2) Treble clef, Minim, Dotted semibreve
(3) Treble clef, Minim, Dotted Minim (4) Treble clef, crotchet, Dotted crotchet



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## පෙරදිග සංගීතය - II

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 02 යි.

පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (i) ධ̤ නි̤ ස ග̲ ම ග̲ රි̲ ස, මෙම ස්වර ඛණ්ඩය අයත්වන රාගය නම් කරන්න.

(ii) "නි̤ රි ස , නි̤ රි ග රි ස", යමන් රාගයට අනුව මෙම ස්වර අභ්‍යාසයේ ඊළඟ පියවර ලියන්න.

(iii) "හමන මදනල ගතට සුවදේ" මෙම ගී පාදය සඳහා උචිත හින්දුස්ථානී තාලය කුමක් ද?

(iv) නම් කරන ලද තාලයට ගැළපෙන දේශීය තිත නම් කරන්න.

- පහත වගුවේ සඳහන් (v) සිට (viii) දක්වා හිස්තැන්වලට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(වෙස්සන්තර. සිංහබාහු, මනමේ, ඉයුජින්)

| නව නාට්‍ය ගී පාදය | ගීතය ඇතුළත් නව නාට්‍යය | තනුව උපුටා ගත් පැරණි නාඩගම |
|---|---|---|
| නන් සිරින් වොරැදි | (v) .............................. | (vi) .............................. |
| දස දෙස ඉන්ද්‍රා | (vii) .............................. | (viii) .............................. |

(ix) (x) ප්‍රශ්නවල හිස්තැන් සඳහා වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.

(ix) ඔබයි රම්‍ය සඳ කිරණ සන අන්ධකාරේ යන ගීතය .............................. තාලයට අනුව .............................. ග්‍රහයෙන් ගැයේ.

(x) පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට යන ගී පාදය .............................. සංදේශයට අයත් එය .............................................. විරිතට අනුව ගැයේ.

(02) පහත දැක්වෙනුයේ නිර්දේශිත රාග දෙකකට අයත් සර්ගම් ගී පාදයි.

A - නි ධ - ප / ම̍ ප ග ම̍ / ප - - - / ප ම̍ ග රි /

B - ම ග̲ රි̲ / ස රි̲ නි̤ / ස - ධ̤ / නි̤ ස - /

(i) ඉහත ගී පාදඅයත් රාග නම් කරන්න.

(ii) ඉහත රාගවලට අයත් ආරෝහණ, අවරෝහණ, වාදී, සංවාදී ස්වර, මුඛ්‍යාංගය, ගාන සමය ලියා දක්වන්න.

(iii) එම රාග දෙක අතරින් ඔබ වඩාත් කැමැති රාගයේ මධ්‍යලය ගීතයේ ස්ථායී කොටස ස්වර ප්‍රස්තාර ගත කරන්න.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(03) පහත දක්වා ඇත්තේ මෙරට සරල ගී සඳහා බහුලව යොදා ගන්නා හින්දුස්ථානි තාල පදයකි.

/ධ ගෙ න ති / න ක ධි න /

(i) එම තාලය නම් කරන්න.

(ii) එම තාලයේ සඳහන් අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත්වන ආකාරය අනුව වෙන්කර දක්වන්න.

a. දායාවෙන් පමණක් උපදින අක්ෂර

b. බායාවෙන් පමණක් උපදින අක්ෂර

c. දායාව. බායාව එක විට වැයීමෙන් ලැබෙන අක්ෂර

(iii) නිර්දේශිත තාල අතරින් මාත්‍රා අසමානව බෙදෙන තාල දෙක නම් කර ඉන් ඔබ කැමැති තාලයක් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

(iv) ප්‍රස්තාර කරන ලද තාලයට ගායනා කළ හැකි ගී පාද දෙකක් ප්‍රස්තාර කරන්න.

(04) මෙරට ජන සංගීතයෙහි වියත් බසින් රචනා වූ ගීත මෙන්ම ගැමියන් විසින් නිර්මිත ගීත ද ව්‍යවහාරයේ පවතී.

(i) එම ගී වර්ග දෙක පිළිවෙළින් නම් කරන්න.

(ii) කරුණු හතරක් යටතේ එම ගි වර්ග දෙකෙහි ලක්ෂණ සසඳන්න.

(iii) අනාසාතාත්මක ගැමි ගී වර්ග දෙකක් නම් කර එක් එක් වර්ගයට අයත් ගී පාද දෙක බැගින් ලියන්න.

(05) පහත දැක්වෙනුයේ විවිධ ගී වර්ග පිළිබඳ තොරතුරු ඇතුළත් අක්‍රමවත් වගුවකි.

| ගී වර්ගය | ගීතය | ගායනය හෝ නිර්මාණය |
|---|---|---|
| a. ග්‍රැමෆෝන් තැටි ගී | රස ආහාර කවලා | ආනන්ද සමරකෝන් |
| b. ගුවන් විදුලි සරල ගී | ප්‍රේමයෙන් මනරංජිත වේ | M. S. ප්‍රනාන්දු |
| c. කපිරිඤ්ඤා ආශ්‍රිත සරල ගී | ශ්‍රී රාහුල හිමිගේ නාමේ | මනමේ |
| d. නාඩගම් ශෛලියේ නව නාට්‍ය ගී | එන්ඩද මැණිකේ | H. W. රූපසිංහ |

(i) ඉහත වගුවෙහි සඳහන් තොරතුරු එක් එක් ඉංග්‍රීසි අක්ෂරය යටතේ නිවැරදි ලෙස තීරුගත කරන්න.

(ii) ගැමෆෝන් තැටි ගීවල දැකිය හැකි විශේෂ ලක්ෂණ හතරක් ලියන්න.

(iii) මුල් යුගයේ ගුවන් විදුලි සරලගී සඳහා දායකවූ සංගීතඥයින් දෙදෙනකු නම් කරන්න.

(iv) පැරණි නාඩගම් සම්ප්‍රදාය ආභාෂය කර ගනිමින් නිර්මිත නව නාට්‍ය දෙකක් නම් කරන්න.

(06) සංගීතයේ මාධ්‍යය වනුයේ නාදයයි. නාදය හා සම්බන්ධ ඔබ උගත් කරුණු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) නාදයේ ත්‍රිවිධ ගුණ නම් කරන්න.

(ii) පහත සඳහන් කරුණු නම් කරන ලද ත්‍රිවිධ ගුණ අනුව වෙන් කර ලියන්න.

a. ස්වර සප්තකය ආරෝහණ වශයෙන් වැයීමේ දී නාදය ක්‍රමයෙන් ඉහළ යාම

b. විවිධ සංගීත භාණ්ඩවල ස්වභාවය හා නාදය නිකුත් වන ආකාරය අනුව නාදයේ වෙනස්වීම

c. බෙරයකට සෙමින් හා වැරෙන් තට්ටු කිරීමේ දී ඇතිවන නාදයේ වෙනස් වීම

d. එකම ගීතයක් විවිධ පුද්ගලයින් ගැයීමේ දී සිදුවන වෙනස්වීම

e. එකම ස්වරය මන්ද්‍ර මධ්‍ය හා උච්ච ලෙස වැයීමේ දී නාදයේ සිදුවන වෙනස් වීම

f. එකම ගීතය ළඟට හා දුරට ඇසෙන සේ හඬ අඩු වැඩි කොට ගායනා කිරීමේ දී සිදුවන වෙනස්වීම

(iii) බටහිර සංගීතයට අනුව නාදයේ ත්‍රිවිධ ගුණ නම් කරන්න.

(07) (i) ශ්‍රී ලාංකිය ජන සංගීත ක්ෂේත්‍රයේ උන්නතියට දායක වූ සංගීතඥයින් දෙදෙනෙකු නම් කරන්න.

(ii) ඔවුන්ගෙන් මෙරට සංගීත ක්ෂේත්‍රයට සිදුවූ වැදගත් සේවාවන් දෙක බැගින් ලියන්න.

(iii) ප්‍රවීන සංගීතඥ ලයනල් රංවල මහතා අතින් නිර්මිත ගීත තුනක් නම් කරන්න.

(iv) සංගීත ක්ෂේත්‍රයේ අති දක්ෂ සංගීතඥයෙකු ලෙස සැලකෙන ඒ.ආර්.රහුමාන්ගේ සේවය පිළිබඳ කරුණු තුනක් ලියන්න.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk